# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. SA/FIR/03/07/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2024.01.18 |

**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 01/2024** (රා.මු.ච. 02/2020 - 07.1 ඡේදය)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>මු.රෙ. 426 යටතේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2024 වර්ෂය සඳහා මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය</u>**

රජයේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2024 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා අදාල මාසික ගිණුම් සාරාංශ පහත 05 වන ඡේදයේ දැක්වෙන පරිදි අදාල නියමිත දිනට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් එක් එක් මාසය සඳහා වූ ඒකාබද්ධ මාසික ගිණුම් ප්‍රකාශන එළැඹෙන මාසයේ 10 වන දිනට පෙර පිළියෙල කරනු ලබන බැවින් නියමිත දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය **"cigassummary@sad.treasury.gov.lk"** විද්‍යුත් තැපැල වෙත එවිය යුතු බව අවධාරණය කරනු ලැබේ. සාවද්‍ය දත්ත භාණ්ඩාගාර ගිණුම් වලට ඇතුලත් වීම වළක්වා ගැනීම සඳහා New CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුලත් කරන දත්ත දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු පමණක් එවීමට අදාල නිලධාරීන් වග බලා ගත යුතුය. එබැවින් මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය පරික්ෂා කිරීමෙන් පසුව අදාල වන පරිදි ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ **රාජකාරී විද්‍යුත් තැපැල (e-mail)** හරහා පමණක් එවන ලෙස උපදෙස් ලබා දිය යුතුය.

3. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේදී යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් සාරාංශ එවන ලද විද්‍යුත් තැපැලටම වහාම දැනුම් දෙනු ලබන අතර, අවශ්‍ය නිවැරදි කිරීම් කර නියමිත දිනට පෙර එවිය යුතු වේ. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරනු ලබන බවද අවධාරණය කෙරේ.

4. යම් කිසි තාක්ෂණික ගැටළුවක් තිබේ නම් ඒ සම්බන්ධව පහත සඳහන් නිලධාරීන් දැනුවත් කර නිවැරදි කරවාගත හැකි බව ද කාරුණිකව දන්වමි.

| | | | |
|---|---|---|---|
| ඒ.ඩී.එල්.ජී.කලන්සූරිය මහතා<br>kalansuriya.adlg@sad.treasury.gov.lk | - | අති.අධ්‍යක්ෂ ජනරාල් | - 0112151488 |
| එස්. තර්ෂන් මහතා<br>tharshan.s@sad.treasury.gov.lk | - | අධ්‍යක්ෂ | - 0112484826 |
| එල්.පී.වැවලගේ මහතා<br>wewalage.lp@sad.treasury.gov.lk | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ | - 0112034518 |


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk

5. පහත වගුවේ දක්වා ඇති දිනට හෝ ඊට පෙර 2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාසික ගිණුම් සාරාංශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුය.

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට ගිණුම් සාරාංශ එවිය යුතු අවසාන දිනය. | | | |
|---|---|---|---|---|
| | උපලේඛණ - I | | උපලේඛණ - II | |
| ජනවාරි | පෙබරවාරි | 2 | පෙබරවාරි | 7 |
| පෙබරවාරි | මාර්තු | 4 | මාර්තු | 7 |
| මාර්තු | අප්‍රේල් | 2 | අප්‍රේල් | 5 |
| අප්‍රේල් | මැයි | 3 | මැයි | 8 |
| මැයි | ජූනි | 4 | ජූනි | 7 |
| ජූනි | ජූලි | 2 | ජූලි | 5 |
| ජූලි | අගෝස්තු | 2 | අගෝස්තු | 7 |
| අගෝස්තු | සැප්තැම්බර් | 3 | සැප්තැම්බර් | 6 |
| සැප්තැම්බර් | ඔක්තෝම්බර් | 2 | ඔක්තෝම්බර් | 7 |
| ඔක්තෝම්බර් | නොවැම්බර් | 4 | නොවැම්බර් | 7 |
| නොවැම්බර් | දෙසැම්බර් | 3 | දෙසැම්බර් | 6 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් 2024 මුදල් වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 429 පරිදි නිකුත් කරන ගිණුම් පියවීමේ මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි | | | |

ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව